---

කුරුණෑගල ප්‍රාදේශිය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). හිඟ අක්කර බදු ශේෂය ගිණුම් උපලේඛණ අනුව රු.300,649 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.71,334 ක් ලෙස ගෙන තිබීමෙන් වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු.229,315 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) හිඟ වෙළඳ බලපත්‍ර ශේෂය ගිණුම් උපලේඛණ අනුව රු.944,176 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.489,987 ක් ලෙස ගෙන තිබීමෙන් වර්ෂය අවසානයට හිඟ වෙළඳ බලපත්‍ර ශේෂය රු.454,189 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.3,917,514 ක් වුවද, ලේඛණ අනුව එය රු.1,807,167 ක් වූයෙන් ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.2,110,347 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ජනල් සටහන් මගින් වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදල හරහා රු.5,512,625 ක් කපා හැර තිබුණි.

(ඈ). ලේඛණ අනුව වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම් රු.20,451,092 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.22,434,388 ක් ලෙස දක්වා තිබීම නිසා වැටුප් ප්‍රතිපූර්ණ රු.1,983,296 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඉ). විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු…5,395,855 ක් ව දායක මුදල ණය හමියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණු අතර, වර්ෂයට අදාල රු…140,405 ක මුදල ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.53,142,176 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.17,896,725 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,010,654 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.128,699,926 ක් වු අතර, එයින් රු.51,380,407 ක ශේෂයක් පමණක් උපලේඛණ මගින් තහවුරු වූ අතර, ඉතිරි රු.77,319,519 ක ණය ශේෂයක් දිගින් දිගටම නිරවුල් කිරීමකින් තොරව පැවති අතර, එයින්ද 2007-2011 කාලයට අදාල රු.1,612,041 ක ණයගැතියන් සඳහා පමණක් කාල විශ්ලේෂණ හඳුනාගෙන පැවතුණි. එමෙන්ම කර්මාන්ත අත්තිකාරම් ලෙස පවතින රු.1,763,478 ක ශේෂය දීර්ඝ කාලයක සිට පවතින අතර ලේඛන මගින් සනාථ කරගෙන නොතිබුණි.

(ආ). වර්ෂය අවසානයට පැවති රු.5,036,785 ක තැන්පතු ශේෂය තුල 2009 වර්ෂයේ අවසථා 03 කදී රක්ෂණ වන්දි ලෙස ලැබී තිබූ රු.31,421 ක්ද, ජාතිය ගොඩනැගීමේ අරමුදල වෙනුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.77,123 ක්ද, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විවිධ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් 2009 හා 2010 වර්ෂ වලදී ලැබී තිබූ රු.708,000 ක්ද, නිරවුල් නොකර හෝ අදාල කාර්යවල නොයොදවා පැවතුණි. එමෙන්ම නිකුත් කලද ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත් ලෙසට 2010 වර්ෂයේදී තැන්පත් ගිණුමට ගත් රු.183,075 ක ශේෂයක්ද, 2011 වර්ෂයේදි තැන්පත් ගිණුමට ගත් රු.30,000 ක ශේෂයක්ද පැවතුණි. එමෙන්ම වෙනත් ආයතන වෙත තැන්පත් ලෙස දිගින් දිගටම පැවත එන රු.70,180 ක ශෙෂයක්ද ගිණුම් වල ඇතුලත් වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 2,342 | 1,952 | 1,974 |
| (ii) | බදුකුලී | 2,431 | 2,309 | 435 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,132 | 2,961 | 490 |
| (iv) | වෙනත් ආදායම් | 69,554 | 72,975 | 3,917 |

### 2.3.2 වරිපනම් බදු

(අ). සභාවේ ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.578,234 ක් ව අතර එයින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 33-42 විධිවිධාන පරිදි වීදි 06 කට අදාලව ඒකක 119 ක් වෙනුවෙන් වූ රු.312,585 ක සඳහා පමණක් හිඟ ලැයිස්තු සකස්කර තිබුණි. එයින් ස්ථාන 64 ක් යටතේ රු.258,129 ක හිඟ සඳහා අවසන් නිවේදන නිකුත් කර පැවති අතර, ඒකක 54 කට අදාලව රු.111,329 ක හිඟයක් පමණක් අයකර ගෙන පැවතුණි. අයනොවූ ශේෂයන් අතර, දීර්ඝ කාලයක සිට පැවත එන වරිපනම් ඒකක 06 කට අදාලව රු.108,805 ක පමණ හිඟයක් පැවතුණි. එමෙන්ම සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශයක් ලෙස පවතින මිගමුපාර, පුත්තලම්පාර, දඹුල්ල පාරට අයත් ප්‍රදේශ වල වරිපනම් බදු පනවා අයකිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

(ආ). වැල්ලව උපකාර්යාල බල ප්‍රදේශයට අදාලව වරිපනම් තක්සේරුවක් 2001 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබූ අතර, සමාලොචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.1,068,999 ක් විය. එයින් හිරිපිටිය කොට්ඨාශයට අදාලව කාර්තු 04 සිට 147 දක්වා පරාසයක හිඟ හිටි වරිපනම් බදු ශේෂය රු.93,530 ක් හා රාජ්‍ය දේපල 5 කට අදාලව වරිපනම් බදු හිඟය රු.116,027 ක් විය. මෙකී හිඟයන් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158-159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 33-42 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එමෙන්ම වරිපනම් ලේඛන 06 ක් සමාලෝචිත වර්ෂය අවසානයට තුලනය කර නොතිබූ අතර උප කාර්යාල බල ප්‍රදේශයට අයත් නොමැතියි සඳහන් ස්ථාන 5 ක් වෙනුවෙන් බිල්කර පැවති රු.8,925 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල්ව නොපැවතුණි.

2.3.3 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

(අ). වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු යටතේ, 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 65 හා 66 විධිවිධාන පකාරව හා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150(4) විධිවිධාන ප්‍රකාරව අදාල කාල වකවානු වලදි කටයුතු නොකිරීම හේතුවෙන් රු.342,126 ක පමණ හිගයක් පැවතුණි.

(ආ). වෙළඳ බලපත්‍ර ලබාගැනීම සඳහා අවස්ථා 1015 යටතේ මුදල් ලබාගෙන පැවතියද, එයින් බලපත්‍ර ලබාදී පැවතියේ සථාන 481 ක් සඳහා පමණි.

(ඇ). මස්, මාළු අලෙවිය සඳහා වෙළඳ අයිතිය බදුදුන් ස්ථාන 22 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබාගෙන ඇති බවත් වෙළඳ බලපත්‍ර ලේඛන වල දක්වා නොතිබුණි. එහෙත් එයින් ස්ථාන 4 ක් වෙනුවෙන් වෙළඳ බලපත්‍ර ලබාගැනිම සඳහා මුදල් ගෙවා පැවති බව අදාල ලදුපත් අනව හඳුනාගත හැකි වුවත්, එකී අවස්ථාවන් වෙළඳ බලපත්‍ර ලේඛනවල සටහන් කර නොතිබුණි.

2.3.4 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල පිහිටුවා ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සංඛ්‍යාව 30 වන අතර, 2010, 2011, 2012 වර්ෂවලදි පෙරසැරි ගාස්තු ලෙස රු.600,000 ක් අයකරගෙන තිබූ අතර මෙකී කුළුණු වෙනුවෙන් වාර්ෂික වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු ගාස්තුවක් අයකර නොතිබුණි.

2.3.5 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ, ලියාපදිංචිය හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් සිදුව නොතිබූ අතර, වාහන නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථා සම්මත කර ඒ අනුව ක්‍රියාකිරීමටද කටයුතු කර නොතිබුණි.

2.3.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

2.3.7 <u>පරිසර බලපත්‍ර ගාස්තු</u>

2011 වර්ෂයේ ව්‍යාපාර 112 ක් වෙනුවෙන් පරිසර බලපත්‍ර ලබාදීමෙන් රු.151,250 ක ආදායමක් උපයාගෙන තිබූ අතර 2012 වසරේදී ව්‍යාපාර 71 වෙනුවෙන් පාරිසරික බලපත්‍ර ලබාදීමෙන් රු.78,500 ක් උපයා තිබුණි. ඒ අනුව 2011 වර්ෂයට සාපේක්ෂව බලපත්‍ර ලබාදුන් ස්ථාන සංඛ්‍යාව 41 ක් පමණ අඩුව පැවතියද, ඒ පිළිබඳ පරීක්ෂාවන් සිදුකර සොයා බැලීමක් සභාව විසින් සිදුකර නොතිබුණි.

2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව, වගකිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුල පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.95,000 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

2.5 අවිධිමත් ගනුදෙනු

පළාත් පාලන ආයතනවල නගරාධිපති, සභාපතිවරු හා නිලධාරීන් වෙනුවෙන් 2012 අගෝස්තු 09 දින සිට 16 දින දක්වා වූ වියට්නාම සංචාරය සඳහා වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජුලි 25 දිනැති අංක GGRC/21/30 දරන ලිපිය අනුව අනියම් දීමනා ලෙස දිනකට ඇ.එ.ජ.ඩොලර් 30 ක් බැගින් අනුමත කර තිබුණද මෙකී සංචාරය සඳහා සභාපතිවරයා සහ ලේකම්වරයා විසින් අනියම් දීමනා වශයෙන් රු.261,362 ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

2.6 වත්කම් කළමනාකරණය

(අ). සභාව සතුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.33,115,434 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි පැවති අතර ඉඩම් හා ගොඩනැගිලි කාලානුරූපීව සමීක්ෂණයක් කර නොතිබුණි.

(ආ). සභාවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමේ වර්ෂ 12 කට පමණ පෙර ගොඩනැගිල්ලක් ඉදිකර සමෘද්ධි බැංකුවක් පවත්වාගෙන යමින් පැවතියද මෙම ඉඩම් පැවරීම පිළිබඳ හෝ ගොඩනැගිල්ල ඉදිකර ගැනීමට සමෘද්ධි අධිකාරියට දෙනලද අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර මේ සම්බන්ධයෙන් කුලී මුදලක් අයකරගෙන නොතිබුණි.

2.7 සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතු දේපල වල අයිතිය නීත්‍යානුකූලව තහවුරු කර නොගැනීම හේතුවෙන් එකී ඉඩම් නිරවුල් කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල නීතිඥ ගාස්තු හා මිනින්දෝරු ගාස්තු වශයෙන් රු.537,740 ක් වැයකර තිබුණි. 2012 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් සම්බන්ධ නඩු 8 ක් පැවතියද ඉන් ලිපිගොනු 3 ක් පමණක් විගණනයට ඉදිරිපත් වූ අතර එම ගොනුවලද නඩුවලට අදාල වර්තමාන තොරතුරු ගොනුගතව නොතිබුණි.

(ආ). සභාව විසින් වදුරාගල වෙරළුගොල්ල සුසාන භූමියේ ආදාහනාගාරයක් ඉදිකරමින් තිබියදී 2007 වර්ෂයේ ඊට විරුද්ධව නඩුවක් පැන නැගී තිබූ අතර උසාවිය දුන් වාරණ නියෝගයක් හේතුවෙන් ඉදිකිරීම් නවතා ඇති අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අදාල නඩුව අවසන්ව නොපැවති අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් නීතිඥ ගාස්තු ලෙස රු.173,500 ක් වැයකර තිබුණි.

(ඇ). කුඩාගල්ගමුව මංසන්දියේ පර්චස් 30 ක ඉඩම් කොටසක් මීට වර්ෂ 10 කට පමණ පෙර ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් "පිං බෙහෙත් ශාලාවක් ඉදිකිරීම" සඳහා සභාව වෙත පවරා තිබූ අතර, සභාව විසින් එම අරමුණට අදාල කිසිදු කාර්යයක් සිදු නොකර එකී ඉඩමේ කාර්යාල සංකීර්ණයක් හා ආයුර්වේද සායනයක් ඉදිකිරීමට යාමේදී ඉඩම පැවරූ පැවරුම් ලාභියාගේ ඥාතීන් විසින් එම ඉඩම නැවත තමන්ට ලබාදෙන ලෙස ඉල්ලා 2012 වර්ෂයේදී නඩු පවරා තිබුණි.

2.8 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…5,395,855 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසක වාරිකය ලෙස රු…15,419 බැගින් එකී අරමුදල විසන් අයකර පැවතියද, එකී අයකිරීම් සභාවේ කුමන සෙවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ආ). 2009 සිට 2011 දක්වා, ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර 1377 ක් අනුමත කර පැවතියද එයින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අනුකූලතා සහතික ලබාගෙන තිබුනේ ස්ථාන 122 ක් සඳහා පමණක් වූයෙන් සහතික ලබාගෙන නොතිබූ ස්ථාන පිළිබඳ සොයා බලා කාලය දීර්ඝ කිරීම හෝ ප්‍රමාද ගාස්තු අයකිරීම කෙරෙහි සභාව අවධානය යොමුකර නොතිබුණි.

(ඇ). සභාව විසින් යන්ත්‍රෝපකරණ කුලියට ගැනිම සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.5,607,000 ක් ගෙවීම් කර තිබූ අතර, එකී සේවාවන් ලබාගැනීම සඳහා අදාල ආයතනය සමග ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. එමෙන්ම මිල ගණන් කැඳවීමේදී අවම මිල ගණන් යටතේ තෝරාගත් ආයතනයට පරිභාහිරව මීටර් පැයකට රු.2,600 කට ඉන්ධන රහිතව යන්ත්‍රෝපකරණ අධිකාරියෙන්ද යන්ත්‍රයක් ලබාගෙන සමාලෝචිත වර්ෂය තුල ඒ වෙනුවෙන් රු.1,481,568 ක්ද ගෙවා තිබුණි.

(ඈ) සභාව විසින් සමාලොචිත වර්ෂයට අදාලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත එකතු කල අගය මත බදු මුදල් (වැට්) ප්‍රේෂණය කිරීමේදී, බාහිර පාර්ශවයන් වෙත ගෙවනු ලැබූ වැට් බදු අඩුකර ගෙන නොතිබූ අවස්ථා පැවති අතර, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලයට අදාලව එලෙස අඩුකර නොගත් වැට් බදු වටිනාකම රු.1,055,161 ක් විය.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය